THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 1 - Issue I
December 2021

T J O L C
ISSN 2806-5395

Category: Research Article

# සිංහල නවකතාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය නිරූපණය

## (සුමිත්‍රා රාහුබද්ධගේ අග පිපි මල් නවකතාව ඇසුරින්)

කුමුදු කරුණාරත්න රණවීර

**ARTICLE DETAILS**

Published Online & Printed
December 2021

***Author:***

ආචාර්ය කුමුදු කරුණාරත්න රණවීර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල අධ්‍යයනාංශය,
කොළඹ විශ්වවිද්‍යාලය.
*Email: kumudukr@yahoo.com*

***Keywords:***
Aga Pipi Mal, Sumithra Rahubadda, Gender, Sinhala Novel, Sociology of Literature

## Abstract

A true literary work, on the one hand, honestly and clearly reflects the truth of human life, and on the other hand, it reflects the various forces at work in the society in which the book was written. This is a powerful literary genre. Sumithra Rahubadda's Agi Pippi Mal (1998) explores how reality reflects the masculinity of society, as well as how it portrays the masculinity of society. What is further explored here is what the vision looks like. It seeks to identify the ideology underlying how women are built in Sri Lanka by their digital socio-economic background. As a theoretical approach, society presents literature in the methodology of literary study as an overview of the era in which it originated, as well as the feminist approach, as well as qualitative analytical data analysis and analysis of Marxist literary theory. Aga Pipi Mal, a female author, a female-centric novel, reliably explores the reality of contemporary Sri Lankan gender equality or the reality of Sri Lankan women.

## හැඳින්වීම

සමාජයක් ස්ත්‍රී හා පුරුෂ යන සාමාජිකයින් දෙපිරිසෙහි සංයුතියෙන් ගොඩනැගුණකි. සුවිශේෂ ජීව විද්‍යාත්මක ලක්ෂණවලින් සමන්විතව ගොඩනැගී ඇති මේ ස්ත්‍රී පුරුෂභාවය පුද්ගල උත්පත්තියත් සමගම හිමි වන ලිංගිකත්වයේ වෙනසෙහි ප්‍රතිඵලයකි. ජීව විද්‍යාත්මක වශයෙන් ස්ත්‍රියට හා පුරුෂයාට හිමි වී ඇති මේ වෙනස 'ස්ත්‍රී පුරුෂභාවය' නැතහොත් ස්ත්‍රී පුරුෂ විභේදනය ලෙස හැඳින්වේ. මෙකී ජීව විද්‍යාත්මක විභේදනය පදනම් කොට ගනිමින් ස්ත්‍රිය හා පුරුෂයා කෙරෙහි ගොඩනගා ඇති සමාජමය බෙදීම 'ස්ත්‍රී පුරුෂ සමාජභාවය' යනුවෙන් හැඳින්වේ. ජීව විද්‍යාත්මකව ස්ත්‍රියට හා පුරුෂයාට ලැබී ඇති ලිංගික වෙනස මත දීර්ඝ කාලයක් පුරා සමාජය විසින් එකිනෙකට වෙනස් වූ සමාජ තත්ව මේ දෙපිරිස වෙත නිර්මාණය කර දී තිබේ. ජීව විද්‍යාත්මක වශයෙන් ස්ත්‍රී පුරුෂ දෙකොටසක් වුවද ස්ත්‍රී ලිංගිකත්වයට සුවිශේෂ වූ ගුණාංග ආරෝපණය කිරීමක් දක ගත හැකිය. ලෝකයේ සැම තැනකම පවතින මෙකී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කම් බොහෝ විට පීතෘමූලික වේ (Renzetti and Curran 1992 : 02; හාසින් 2000 ඃ 01).

මෙසේ සමාජ සංස්කෘතික වශයෙන් නිර්මිත ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අර්ථ දැක්වීම් ප්‍රකටව මෙන්ම අප්‍රකටව ද සැම තලයකදීම ක්‍රියාත්මක වෙයි. මිනිසා විෂයයෙහි විභේදන නිර්මාණය කරන්නා වූ අවශේෂ සකලවිධ මූලයන් සලකා බැලුව ද එකී සැම සාධකයක් මතම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය ක්‍රියාත්මක වනු දක්නට ලැබේ. පුද්ගලයා විසින්ම නිර්මිත ධනය, බලය, කුලය සහ පන්තිය ආදී වූ සමාජ ගොඩනැගීම් මානව සමාජය අසාධාරණ ලෙස බෙදා වෙන් කරන අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය කරන කොට ගෙන ක්‍රියාත්මක වන පීතෘ මූලිකත්ව ආකල්ප මෙකී විභේදනයන්හි බලපෑම වඩාත් තීව්‍ර කරන සාධකයක් බවට පත්වී තිබේ. ඒ අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය යම් සංසිද්ධියක් පුරුෂයා විෂයෙහි බලපෑම් කරන ආකාරයත් ස්ත්‍රිය විෂයෙහි බලපෑම් කරන ආකාරයත් දෙයාකාරයකින් තීරණය කරයි. මේ තත්වය සැම සමාජ සන්දර්භයකදීම ස්ත්‍රිය විෂයෙහි ක්‍රියාත්මක වන්නේ වඩා නිශේධනාත්මක හා ප්‍රජා පීඩක ප්‍රවේශයකිනි. ඒ මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රිය පීඩාවට පත් වීමේ යථාර්ථය තහවුරු කෙරෙයි. ලාංකේය සමාජය සම්බන්ධයෙන් විමසා බැලීමේදී බොහෝ දෘෂ්ටිවාදවලට විභේදනය හේතු වන බව නිරීක්ෂණය කළ හැකිය.

කලාවේ උත්කෘෂ්ට අපේක්ෂාවක් වන්නේ වඩා සුභවාදී ලෝකයක් නිර්මාණයෙහිලා සහෘදයා ඥානනය කිරීමයි. එහෙයින් ප්‍රතිගාමී, ප්‍රජා පීඩක සමාජ ගොඩනැගීම්වලට එරෙහිව අරගල කිරීම යථාර්ථවාදී කලාකරුවා අබියස වන අභියෝගයයි. අසාධාරණ සමාජ විභේදන ප්‍රශ්න කරමින් වඩා සාධාරණ සමාජයක් නිර්මාණය කිරීම ස්වකීය වගකීම කොට ගත් නිර්මාණ අතර නවකතාවට ලැබෙනුයේ ප්‍රමුඛ ස්ථානයකි. සමාජ නිර්මිතයක් වන, සමාජ ජීවිතය විවරණය කරන නවකතාව සමාජයෙහි ක්‍රියාත්මක ස්ත්‍රී පුරුෂ සමාජභාවය නම් වූ පුද්ගල විභේදනීය මූලය තේමා කොට ගැනීම හේතුවෙන් ද නූතනයේ වඩා ඵලදායී සාහිත්‍ය ප්‍රවර්ගයක් ලෙස ස්වකීය අනන්‍යතාව ප්‍රකට කිරීමෙහි සමත් වී තිබේ.

ලාංකේය සමාජයෙහි ක්‍රියාත්මකව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය නූතන සිංහල නවකතාවේ නිරූපණය වී ඇත්තේ කෙසේද? මෙකී විභේදනය හේතු කොට ගෙන නිර්මිත තත්වය සම්බන්ධ නවකතාකරුවාගේ දෘෂ්ටිමය ආස්ථානය කුමක්ද? නවකතාකරුවා ප්‍රතිගාමී දෘෂ්ටිවාදවලට අභියෝග කොට ඇත්තේ කෙසේද? සහෘදයා නිර්මාණකරුවාගේ සමාජ මැදිහත්වීම ඥානනය කරන්නේ කෙසේද? යන්න සුමිත්‍රා රාහුබද්ධගේ **අග පිපි මල්** (1988) නවකතාව ඇසුරෙන් විමර්ශනය කිරීම මෙම ලිපියෙන් සිදු කෙරෙයි.

## පර්යේෂණ ගැටලුව

සාහිත්‍ය මගින් සහෘදයා ඥානනය කිරීමෙහිලා ලාංකේය සමාජයෙහි ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් යථාර්ථවාදී නවකතාකරුවාගේ දෘෂ්ටිමය ආස්ථානය කුමක්ද? මානව ප්‍රගමනයට එරෙහි ප්‍රතිගාමී දෘෂ්ටිවාද නිශේධනය කරමින් පාඨක ජීවිතාවබෝධය පෘථුල කිරීමෙහිලා නවකතාකරුවා සමත් වී දැයි විමසා බැලීම සඳහා සුමිත්‍රා රාහුබද්ධගේ අග පිපි මල් (1998) නවකතාව පාදක කොට ගනු ලැබේ.

## පර්යේෂණ අරමුණු

(1) මෙරට සමාජ සන්දර්භයෙහි ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය යථාර්ථවාදී නවකතාව මගින් ප්‍රතිනිර්මාණය කර තිබේද?

(2) පාඨක ජීවිතාවබෝධය පුළුල් කිරීමෙහිලා චරිත හා අවස්ථා ගොඩනැගීමේදී නූතන නවකතාකරුවා කොතෙක් දුරට සාර්ථක වී ඇත්දැයි විමසා බැලීම.

(3) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය ස්ත්‍රී කේන්ද්‍රීය දෘෂ්ටියකින් විමසා බැලීම.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය මූලික වශයෙන් සාහිත්‍යමය මූලාශ්‍රය පදනම් කොට ගත්තකි. වර්ෂ 1998 ප්‍රකාශිත සුමිත්‍රා රාහුබද්ධගේ අග පිපි මල් නවකතාව මෙම අධ්‍යයනයෙහි ප්‍රාථමික මූලාශ්‍රය වෙයි. මෙහිදී සමාජීය සාහිත්‍ය අධ්‍යයන න්‍යාය, මාක්ස්වාදී සාහිත්‍ය න්‍යාය, ස්ත්‍රීවාදී සාහිත්‍ය න්‍යාය හා නිර්ප්‍රභූ අධ්‍යයන ප්‍රවේශය හා ඊට අදාළ සංකල්ප ද අවශ්‍ය පරිදි භාවිත කෙරේ. දත්ත විශ්ලේෂණය සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ විධි ක්‍රමය ඉවහල් කොට ගැනේ.

## පර්යේෂණයේ වැදගත්කම

* ලේඛිකාවක් විසින් රචිත ස්ත්‍රී චරිතයක් කේන්ද්‍ර කොටගත් නවකතාවක් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය මූලික කොට ගනිමින් ස්ත්‍රී කේන්ද්‍රීය දෘෂ්ටිකෝණයකින් විමසීම.

* සාහිත්‍ය සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විමර්ශනය කිරීමේදී සාහිත්‍ය යනු සමාජ පර්යාවලෝකනයකි යන ප්‍රවාදය මුල් කර ගනිමින් නූතන සිංහල නවකතාව විමර්ශනය කිරීම.

**පසුබිම**

ලිංගිකත්වය (Sex) යනු භෞතික ශරීරය පදනම් කොටගෙන ගොඩනැගී ඇති සංකල්පයකි. ඒ අනුව ලිංගිකත්වය යන්න ජීව විද්‍යාත්මකව උරුම වී ඇති ලිංගය මුල් කොට ගොඩනැගෙන ක්‍රියාකාරිත්වයකි. එනම් මානව ශරීරවල භෞතික ක්‍රියාකාරීත්වයකි. එහෙත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය (Gender) පැහැදිලිවම සමාජ, සංස්කෘතක ගොඩනැගීමකි (Hennietta : ඃ 1994, භාසින් 2000 ඃ 28). ස්ත්‍රිය හා පුරුෂයා විෂයෙහි පවත්නා ද්විත්ව සමාජ ආකල්පය ජීව විද්‍යාත්මක වෙනසට ඌනනය කිරීමට ගත් සවිඥානක පුරුෂමූලික සමාජ ආයාසය රොබර්ට් ස්ටෝලර් (Robert Stoller 1968) වැනි සමාජ විද්‍යාඥයන්ගේ අදහස් දැක්වීම්වලින් හඳුනාගත හැකිය. ඔහුට අනුව ස්ත්‍රී පුරුෂ බව පැහැදිලි වශයෙන් ජෛව විද්‍යාත්මකව හඳුනාගත හැකි අතර අභ්‍යන්තර හා බාහිර ප්‍රජනක ඉන්ද්‍රියන්, ස්ත්‍රී පුරුෂ හෝමෝනමය වෙනස්කම් මෙන්ම ස්ත්‍රියට සාපේක්ෂව පුරුෂයා ශරීර ශක්තියෙන් වැඩීම ආදිය ඊට උදාහරණ ලෙස දක්වයි. එකී ජීව විද්‍යාත්මක විභේදනය පදනම් කොට ගනිමින් ස්ත්‍රිය හා පුරුෂයාට සමාජීය කාර්ය කොටස් පවරමින් ජීව විද්‍යාත්මක විෂමතාව මගින් ඔවුන්ගේ සමාජීය විෂමතාව ද තීරණය වන බවට තර්ක කරයි (Stoller 1968 : 15).

ස්ත්‍රිය හා පුරුෂයා අතර ලිංග භේදයට සාපේක්ෂව සමාජයීය වශයෙන් ද ශ්‍රම විභජනයක් පැවතීමේ පදනම ඔවුන් අතර ඇති ජීව විද්‍යාත්මක විෂමතාව බව මානව විද්‍යාඥයකු වන මර්ඩොක් විසින් ද පෙන්වාදෙනු ලැබේ (Mardock 1949 : 07). ජීව විද්‍යාත්මක ලිංග භේදයට සාපේක්ෂව සමාජීය වශයෙන් ස්ත්‍රියට හා පුරුෂයාට වෙනස් වූ භූමිකා හිමි වන බව මානව විද්‍යාඥයකු වූ පාසන්ස්ගේ ද තර්කය වෙයි (Parsons 1955 : 23). ගෘහය ආශ්‍රිත වගකීම සම්බන්ධයෙන් පවත්නා නැමියාව ස්ත්‍රියට ස්වභාවයෙන් හිමි වන්නක් නොව පුරුෂමූලික සමාජය විසින් ස්ත්‍රී සමාජභාවයට හිමි කර දුන්නක් බවට ජෝන් ස්ටුවට් මිල් අවධාරණය කරයි (Mill : 1859). උක්ත මානව විද්‍යාඥයින්ගේ ශ්‍රම විභජනය මූලික කොටගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පුරුෂමූලික ස්ථාවරය ඈන් ඕක්ලේ වැනි ස්ත්‍රීවාදිනියක් විසින් අභියෝගාත්මක ලෙස ප්‍රතික්ෂේප කරනු ලබයි (Orkley 1974). ඒ අනුව ස්ත්‍රී පුරුෂ බව සංස්කාතිකමය ගොඩනැගීමක් වන බවත් 'ගෘහණිය' හෝ 'මාතෘ භූමිකාව' අත්‍යවශ්‍යයෙන්ම ස්ත්‍රිය වෙත ජීව විද්‍යාත්මක වශයෙන් පැවරුණු වගකීමක් හෝ කාර්යයක් නොවන බවත් ඇය තර්ක කරයි (Orkley 1974 : 83). කුඩා කාලයේ සිටම දරුවන් ගැහැනු පිරිමි ලෙසින් සමාජානුයෝජනය කරන්නේ සංස්කෘතිය විසින් බව ඇය වැඩි දුරටත් අවධාරණය කරයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංකල්පය ඒ ඒ සමාජයන්හි පරිණාමයට සාපේක්ෂ සමාජ සංස්කෘතික ක්‍රියාවලිය විසින් ගොඩනගන ලද සමාජයෙන් සමාජයට මෙන්ම යුගයෙන්

යුගයට වෙනස් වෙමින් අඛණ්ඩව ක්‍රියාත්මක වන්නක් බව පැහැදිලි වේ (Margret Medd 1914). ඒ අනුව ස්ත්‍රී පුරුෂ බවට අනන්‍ය වූ නිශ්චිත ක්ෂේත්‍ර ගොඩනැගීම් ඒ ඒ සමාජයට අනුරූප වන ලෙසින් සිදු වන අතර එහෙයින්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය, එය ක්‍රියාත්මක වන සමාජ සංස්කෘතික පරිස්ථිතියෙහි ප්‍රකාශනයක් බවට පත් වේ.

මෙකී සංකීර්ණ ප්‍රපංචය සකලවිධ සමාජ ධූරාවලීන්හි පැතිරෙමින් සංස්කෘතික පුරුදු, සංකේතාත්මක නියෝජන හා භූමිකා මගින් සමාජීය වශයෙන් විවිධාකාරයෙන් අර්ථ ගැන්වෙන අතර ගෘහය, සේවා ස්ථානය, පාසල ආදී වශයෙන් ස්ථානමය බහුවිධතාවයකින් යුක්තව අර්ථ නිරූපණය වෙයි (Ray 1995 : 01). මේ සියලු අර්ථ දැක්වීම් තුළ පොදුවේ ස්ත්‍රිය යනු කුටුම්බගත වූවකු ලෙසත් පුරුෂයා යනු සමාජ සත්වයකු ලෙසත් ස්ථානගත කර ඔවුනට අනුරූප වන භූමිකා පවරා දී තිබේ (Edward Wilson). එහෙයින්ම කිසියම් සමාජයක ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ගොඩනැගීම් තුළ ස්ත්‍රියගේ භූමිකාව විමසා බැලීමේදී ස්ත්‍රීත්වයේ සංස්කෘතික නියෝජනය හා ස්ත්‍රියගේ ආත්ම ප්‍රතිරූපය අවබෝධ කොට ගත යුතු අතර ඇය හා සම්බන්ධ දේශපාලන, ආර්ථික සීමාවන් ද සලකා බැලිය යුතුය. එමෙන්ම ස්ත්‍රිය හා සම්බන්ධ සමාජගත දෘෂ්ටිවාදමය මෙන්ම විඥානමය සීමා පිළිබඳව ද සවිඥානක විය යුතුය. එපමණක් නොව ස්ත්‍රිය හා සම්බන්ධ අධ්‍යයනයකදී අදාළ සමාජයේ ජන විඥානය, සමාජ අගයන් හා සීමා සම්බන්ධයෙන් තියුණු වූත් ගැඹුරු වූත් විමර්ශනයක් සිදු කිරීම ද අවශ්‍ය වෙයි (Ray 1995 : 02).

මෙසේ විවිධ සමාජයන්හි විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය නිර්මිතය ඒ ඒ යුගයෙහි රචනා වූ සාහිත්‍යය මගින් ප්‍රතිනිර්මාණය කෙරෙයි. 'සාහිත්‍යය යනු එය බිහි වූ යුගයෙහි පර්යාලෝකනයකි' යන ප්‍රවාදයට අනුව යථාර්ථවාදී සාහිත්‍යකරුවා තත්කාලීන සමාජීය තත්වයන්හි යථාර්ථය ස්වකීය නිර්මාණ මගින් කලාත්මක ලෙස සමාජගත කිරීමෙහි උත්සුක වන්නෙකි.

සාහිත්‍ය අධ්‍යයනයෙහිදී අදාළ ඇගයීම් සීමා ඉක්මවමින් කෘතිය ප්‍රභවය ලද සමාජය කරා එළැඹ සාහිත්‍යයත් එය පහළ කළ සමාජ බලවේගත් අතර වන අන්තර් සම්බන්ධය අධ්‍යයනය කිරීම සමාජීය සාහිත්‍ය අධ්‍යයන ප්‍රවේශය මගින් සිදු කෙරෙයි. ඒ අනුව සාහිත්‍ය කෘතිය වනාහී ලේඛකයාටම සීමා වූ ස්වකීය පරිකල්පනයේ ඵලයක් ලෙස හෝ හුදෙකලා අත්තනෝමතික චිත්ත ප්‍රබෝධයක් ලෙසින් හෝ පහළ වන්නක් නොව, සමකාලීන මිනිස් ගති පැවතුම්වල පිළිබිඹුවක් මෙන්ම කිසියම් සිතුවිලි දාමයක ප්‍රකාශනයක් ද වෙයි (සුරවීර 1982 : 15, පල්ලියගුරු (1992) 2002 : 08). සාහිත්‍යය, පුළුල් වශයෙන් පරිසරයේත්, පාරම්පරික උරුමයේත්, නිර්මාණාත්මක කෞශල්‍යයේත් ප්‍රකාශනයක් වන බව මේ මගින් අවධාරණය කෙරෙයි. එමෙන්ම සාහිත්‍ය කෘතියකින් අවිඥානිකව හෝ සවිඥානික ලෙස සෑම විටම අදාළ ලේඛනය නියෝජනය කරන සමාජ ස්තරයෙහි මනෝවිඥානය පිළිබිඹු කෙරේ (Lunacharsky 1965 : 13-14). ඒ අනුව සාහිත්‍ය කෘතියක් යනු එය බිහි වූ යුගයේ පුද්ගල අධ්‍යාත්මයේත් සමාජ-සංස්කෘතික-දේශපාලනික මෙන්ම ආර්ථික ක්‍රියාවලියේත් පිළිබිඹුවකි.

එහෙයින්ම ලාංකේය සමාජ-සංස්කෘතික ක්‍රියාවලියෙහිම එක්තරා ප්‍රකාශනයක් වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවයයෙහි ස්වභාවය ද ඒ ඒ යුගයේ බිහි වූ සාහිත්‍ය කෘති මගින් ප්‍රකාශයට පත් වීම අනිවාර්ය වූවකි. විශේෂයෙන්ම නවකතාව නම් සාහිත්‍යික ප්‍රවර්ගය එහි අනන්‍යතාවයෙහි ස්වභාවය විසින්ම මෙකී සමාජ ප්‍රතිබිම්බන කාර්යයෙහිලා සුවිශේෂ වෙයි. සමාජීය සාහිත්‍ය අධ්‍යයනයට අනුව කතුවරයාට කෘතියෙන් වියුක්තව පැවැත්මක් නොවන්නා සේම සමස්ත නිර්මාණය තුළම කතුවරයාගේ දෘෂ්ටිමය ආස්ථානය ප්‍රකාශයට පත් කෙරෙයි. එබැවින්ම ස්ත්‍රී කර්තෘක සාහිත්‍යය කෘතියක් මගින් ප්‍රස්තුත තේමා සම්බන්ධයෙන් වූ ස්ත්‍රී කේන්ද්‍රීය දෘෂ්ටිය ප්‍රකට වීම අනිවාර්ය වූවකි. ඒ අනුව ස්ත්‍රී චරිතයක් ප්‍රධාන කොට ගනිමින් සුමිත්‍රා රාහුබද්ධ නම් ලේඛිකාව විසින් වර්ෂ 1998 දී නිර්මාණය කරන ලද 'අග පිපි මල්' නවකතාව ඇසුරෙන් ලාංකේය සමාජයක ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ආකල්ප සහ එහි ක්‍රියාකාරී ස්වරූපය පිළිබඳවත් ඒ සම්බන්ධ ලේඛිකාවගේ දෘෂ්ටිමය ආස්ථානය විමර්ශනය කිරීමත් මෙම කෙටි ලිපියෙන් සිදු කෙරෙයි.

## සාකච්ඡාව

70 දශකයේ නවකතාකරණයට ප්‍රවිශ්ට වූ සුමිත්‍රා රාහුබද්ධ බුමුතුරුණු, උදානය, දළ රළ පෙළ, කෙළිමඬල, ඉටිපහන්, සුර අසුර, අග පිපි මල්, අරගලය, ලොබ නොසිඳේයා, දුලදුලාය, කන්දක් සේ මා, අත අතනැර, තුරු සමුදා, සිය සියපත් සිය, තම්මැන්නා වශයෙන් නවකතා පහළොවක් රචනා කරමින් සිංහල යථාර්ථවාදී නවකතාවෙහි ප්‍රගමනයට දායකත්වය ලබා දී තිබේ. මේ නවකතා අන්තර්ගතය විමසා බැලීමේදී මින් බහුතරයක් මෙරට ස්ත්‍රිය හා සම්බන්ධ අත්දැකීම් කේන්ද්‍ර කොට නිර්මාණය වීම ද සුවිශේෂ වේ. ඒ අතරින් සැලකිය යුතු නවකතා සංඛ්‍යාවක් මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය මගින් මෙරට ස්ත්‍රිය විෂයෙහි නිර්මාණිත පීඩනය සාකච්ඡා කරයි.

ඒ අනුව රාහුබද්ධ ප්‍රතිනිර්මාණය කරන මෙරට සමාජ-ආර්ථික-දේශපාලනික සහ සංස්කෘතික තලයෙහි ක්‍රියාත්මක ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනය, අග පිපි මල් නවකතාව විමර්ශනය කිරීමෙන් විමසා බැලෙයි. ලේඛිකාවක ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් පොදු දෘෂ්ටිය හඳුනා ගනිමින් ස්ත්‍රී කර්තෘක නවකතාවකට බහු ප්‍රවේශ ඔස්සේ එළැඹීම මේ මගින් සිදු කෙරෙයි.

දොළොස් වසරක විවාහ ජීවිතය අවසානයේ අහේතුකව අන් ස්ත්‍රියක් වෙත බැඳෙන ස්වකීය ස්වාමිපුරුෂයා හැර දමා යුග ජීවිතය නිමා කොට තම දරු දෙදෙනා ද සමග හුදෙකලා දිවියකට ප්‍රවේශ වන 'අමා' නම් මධ්‍යම පන්තික ස්ත්‍රිය හා සම්බන්ධ අග පිපි මල් නවකතාවට විෂය වේ. දරුවන් ද සමග තනිව ජීවිතයට මුහුණදෙන අතර සිදුවන ජීවන අභියෝග ඇසුරෙන් මෙරට ස්ත්‍රියක විෂයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ගොඩනැගීම් ක්‍රියාත්මක වන ආකාරය සමාජ සංස්කෘතික වශයෙන් මෙන්ම ආර්ථික හා දේශපාලනික තලයන්හිදී ද බැලපෑම් කරන ආකාරය මෙහිදී සමීප නිරීක්ෂණයට ලක් කෙරෙයි.

අග පිපි මල් නවකතාවෙහි නිරූපිත වන අමා නම් ස්ත්‍රී චරිතය මගින් ලේඛිකාව පැහැදිලි ලෙස මෙරට ස්ත්‍රිය පිළිබඳ සාකච්ඡාව කිසියම් නිශ්චිත සමාජ ස්තරයක ලක්ෂගත කරයි. ඒ අනුව කෘතිය මගින් ප්‍රතිනිර්මිත අමාගෙන් සංකේතවත් වන ලාංකේය සමාජගත පශ්චාත් යටත්විජිත උගත් මධ්‍යම පන්තික ස්ත්‍රිය පිළිබඳ යථාර්ථය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සන්දර්භයෙහිලා විමසා බැලීමේ අවකාශ ලැබේ. විසිවන සියවස අග භාගයෙහි සුමිත්‍රා ප්‍රතිනිර්මිත ස්ත්‍රිය (අමා), පූර්ව යටත්විජිත ලාංකේය ස්ත්‍රිය සතු වූ සැලකිය යුතු වගකීම් සහගත නිදහස් ජීවිතය ඒ ආකාරයෙන්ම භුක්තිවිඳීමේ නිදහස ලැබූවෙකු නොවේ. එහෙත් පොදු කටයුතුවලින් හා ගෘහයෙන් පරිබාහිර වූ සමාජයෙන් දුරස් නොකළ ගෘහීය නොවන කාර්යයන්හි ද නියුතු වූ බව සනාථ කෙරේ (මුණසිංහ 1998 ඃ 42-83, ආරියපාල, 1962 (1996) ඃ 290, ජයවර්ධන 2012 ඃ 458, එල්ලාවල 1964 ඃ 75). පූර්ව යටත්විජිත යුගයේ දී පුද්ගලයාගේ ජීවනෝපාය කුල ක්‍රමය විසින් සකසනු ලැබීම හේතුවෙන් තම අභිමතය පරිදි වෘත්තියක යෙදීමේ අවකාශ නොවීය. එහෙයින්ම ශ්‍රී ලාංකේය සමාජයෙහි වෘත්තීය මෙන්ම සමාජ තත්ව නිර්මාණයෙහිලා ක්‍රියාත්මක වූ කුල ක්‍රමයට අභියෝග කිරීමට පූර්ව යටත්විජිත අධ්‍යාපන ක්‍රියාවලියට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගල තිරස් හෝ සිරස් සමාජ සංචලනයක් සඳහා තත්කාලීන අධ්‍යාපන ක්‍රමයෙන් පිටිවහලක් නොලැබිණි (ලංකාවේ අධ්‍යාපන සියවස ප්‍රකාශනය 1969 (1995)). එහෙත් මේ පසුබිමෙහි ඒ ඒ කුලයට සාපේක්ෂ වශයෙන් ස්වකීය පවුල් ඒකකය තුළ ස්ත්‍රිය සතු වූ වගකීම් සහගත නිදහස් ජීවිතයත් පොදු කටයුතුවලින් හා ගෘහයෙන් පරිබාහිර වූ සමාජයෙන් දුරස් නොකළ කාර්යයන්හි ද නියුතු වීමේ අවකාශ තිබීමත් සනාථ කෙරේ. පූර්ව යටත්විජිත අවධියෙහි මෙරට අධ්‍යාපනය පන්සල් හා පිරිවෙන් ඇසුරෙහි ක්‍රියාත්මක වූ බැවින් ඒ සඳහා අවකාශ විවෘත වූයේ ප්‍රධාන වශයෙන්ම පුරුෂයා වෙත පමණි. මෙරට ස්ත්‍රියට පොදුවේ අධ්‍යාපන වරප්‍රසාද ලැබීමේ ආරම්භක පියවර පෘතුගීසීන්ගෙනුත් අනතුරුව ලන්දේසීන් විසින් වඩාත් ව්‍යාප්ත කරන ලදුව කිසියම් නීති මාලාවක් ද ඔස්සේ ක්‍රියාත්මක කෙරුණි. නොමිලයේ ලබා දුන් කාන්තා අධ්‍යාපනය අනිවාර්ය කිරීම ද හේතුවෙන් මෙරට බාලිකාවන් විශාල සංඛ්‍යාවක් යටත්විජිත අවධියෙහි පාසල් අධ්‍යාපනයට යොමු වූහ (ලංකාවේ අධ්‍යාපන සියවස ප්‍රකාශනය 1969 (1995)).

බ්‍රිතාන්‍ය ජාතිකයෝ 1796 දී දේවස්ථාන ආශ්‍රිත පන්සල් මගින් මිශ්‍ර අධ්‍යාපනයක් ස්ථාපිත කළහ (Roberts 1995 : 279). මේ අනුව යටත්විජිත අධ්‍යාපන ක්‍රමය රටේ පැවති පන්ති ක්‍රමයට ගෘහණියක හා මවක ලෙස කාන්තාව ගොඩනැගීම පිළිබඳ එම පන්තියේ දෘෂ්ටියට සමපාත වූවකි. මේ අනුව යටත්විජිත අධ්‍යාපනයේ මුඛ්‍ය අරමුණ ධනපති පන්තියේ ස්ත්‍රීන් යහපත් ගෘහණියක් වශයෙන් නිවසෙහි රඳවා ගැනීම වුවද, වැඩි කාලයක් ගත වීමට පෙර ස්වකීය අධ්‍යාපනය වෘත්තීයමය වශයෙන් ඉවහල් කොට ගැනීමට කාන්තාවන් අතරින්ම ඉල්ලුමක් නිර්මාණය විය (Jayaweera 1979 : 266). ඒ අනුව ඔවුන් ක්‍රමයෙන් වෛද්‍ය, නීතිඥ වැනි වෘත්තීන්ට ද අවතීර්ණ වන්නට විය. පශ්චාත් යටත්විජිත ස්ත්‍රිය අනතුරුව නිදහස් අධ්‍යාපනයේ ආලෝකය ලබමින් ඉගෙනීමෙහි උපරිම ඵල නෙලා ගනිමින් පන්ති පදනම් අතික්‍රමණය කරමින් අධ්‍යාපනය ඔස්සේ පිළිගත් වෘත්තීන් වෙත එළැඹීමෙහි අවකාශ

ලැබීය. අග පිපි මල් නවකතාවෙහි ප්‍රධාන චරිත වන අමා මෙසේ නිදහස් අධ්‍යාපනයේ ආධාරයෙන් උසස් අධ්‍යාපනය ලබා නීතිඥ වෘත්තියට පිවිසි මධ්‍යම පන්තික ස්ත්‍රියකි.

මෙරට ඉතිහාසයෙහි අවුරුදු දෙදහසකට අධික කාලයක් තිස්සේ පැවති දේශීය සමාජ ආර්ථික සංස්ථා විනාශ වීමත් 19 වන සියවසේ සිට බටහිර අධිරාජ්‍යවාදී පාලකයන් යටතේ ආරම්භ වූ සමාජ ආර්ථික ක්‍රමයක වර්ධනයත් බොහෝ දුරට සම්පූර්ණත්වයට පත් වූයේ බ්‍රිතාන්‍යයන්ගේ පාලන සමය තුළදීය (De Silva 1981 : 244, වික්‍රමසිංහ 2012 : 18). මෙකී විපරිවර්තනයන්හි අනිවාර්ය ඵලයක් ලෙස ස්ථාපනය වන මෙරට නාගරික මධ්‍යම පන්තික ස්ත්‍රිය හා ස්ත්‍රී ක්‍රියාකාරීත්වයෙහි ක්‍රමික විකාශනයෙහි ප්‍රතිඵලයක් වූ පශ්චාත් යටත්විජිත ස්ත්‍රිය නවකතාවෙහි ප්‍රතිනිර්මිත ස්ත්‍රී භූමිකාවෙහි සීමා මත රැඳෙමින් අවශ්‍ය පරිදි පූර්ව යටත්විජිත ලාංකේය ස්ත්‍රියගේ අවකාශ විමසීමත් ඊට සාපේක්ෂ වශයෙන් යටත්විජිත සහ එහි ජීවත්වන පශ්චාත් යටත්විජිත ස්ත්‍රිය සම්බන්ධ ස්ත්‍රී පුරුෂ සමාජභාවය විමසීමත් ඒ ඇසුරෙන් තත්කාලීන ස්ත්‍රියගේ අනන්‍යතාව මෙන්ම සමාජ සංස්කෘතික ධාරිතාව හඳුනා ගැනීමත් අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙරට පූර්ව යටත්විජිත ස්ත්‍රිය කාලයට, අවකාශයට සහ ව්‍යූහයට අනුව වෙනස් වූ බවත්, යටත්විජිත ව්‍යාපෘතියෙහි අනිවාර්ය වූ නිර්මිතයක් ලෙස ප්‍රතිනිෂ්පාදනය වූ බවත් පශ්චාත් යටත්විජිත යුගයෙහි ද ඊට අදාළ සමාජාර්ථික විපරිවර්තනවලට සාපේක්ෂ වෙනස්කම් අඩු වැඩි වශයෙන් අන්තර් ග්‍රහණය කර ගනිමින් ප්‍රතිනිෂ්පාදිත ස්ත්‍රී භූමිකාව ක්‍රියාත්මක වන බවත් මෙහිදී අවධාරණය කෙරේ. අමාගෙන් සංකේතවත් වන්නේ මෙසේ අතීතයේ පටන් සමාජ ප්‍රවාහය ඔස්සේ මෙරට ප්‍රතිනිෂ්පාදිත මධ්‍යම පාන්තික ධනේශ්වර ස්ත්‍රියයි.

පූර්ව යටත්විජිත ස්ත්‍රියට දේපල අයිතිය මෙන්ම විවාහයෙන් ඉවත් වූ විට පියාගේ දේපලවලින් නඩත්තු වීමේ අයිතිය ද තිබී ඇත. එමෙන්ම පුරුෂයාගේ හෝ භාර්යාවගේ කැමැත්ත අනුව අවශ්‍ය විටෙක විවාහය අතැර දැමිය හැකි වූ අතර භාර්යාව සතු දේපල සම්බන්ධව පුරුෂයාට බලයක් නොවීය (විජයතුංග 1998 : 43). විවාහය සම්බන්ධ රාජ්‍ය මැදිහත්වීමක් නොවූ අතර එය සාම්ප්‍රදායික නීතිය මත තීරණය විය (Hayley 1923 : 627).

ශ්‍රී ලංකාව යුරෝපීයන්ට යටත්වීමත් සමග යුරෝපා සංස්කෘතික, ආර්ථික, දේශපාලන හා සමාජ අදහස්, චර්යා රටා මෙන්ම දෘෂ්ටිවාද ද මෙරටට ප්‍රවිෂ්ට වන්නට විය. ඒ අනුව තත්කාලීනව බ්‍රිතාන්‍යයේ ක්‍රියාත්මක වූ සමාජ සම්ප්‍රදායත්, සිරිත් විරිත් හා කිතුනු ආගමික දෘෂ්ටීන්හි බලපෑමත් සිදු වූ අතර පූර්ව යටත්විජිත සමාජ සංස්කෘතික සම්ප්‍රදායන් ද වෙනස් වෙමින් අභිනව සම්ප්‍රදායක් ගොඩනැගෙන්නට විය. මේ ව්‍යූහාත්මක වෙනස්වීම් මෙරට ස්ත්‍රියගේ තත්ව නිර්ණයෙහිලා තීරණාත්මක ලෙස බලපානු ලැබිණි. පූර්ව යටත්විජිත නැතහොත් සාම්ප්‍රදායික සිංහල විවාහ ක්‍රම දරුවන්ගේ සුජාතභාවය සහ දේපල උරුමය සම්බන්ධව ගැටලු ඇති කරන්නක් බව බ්‍රිතාන්‍යයෝ අදහස් කළහ. එය පීතෘමූලික සමාජයක වූ සාමාන්‍ය විවාහ ක්‍රමයක් නොවුණි. තත්කාලීනව යුරෝපයේ බලපැවැත්වූ මතය වූයේ විවාහය වූ කලී එක් පුරුෂයකු හා එක් ස්ත්‍රියක අතර පමණක් සිදුවන ජීවිත කාලය පුරා

අඛණ්ඩ වූ බැඳීමකි. විවාහය සම්බන්ධව මෙම ශුද්ධ වූ සදාචාරය ලංකාවට හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවක් බව ද ඔවුහු විශ්වාස කළහ (Cordiner (1807); Quoted in Harris 1994 : 23). ඒ අනුව වර්ෂ 1846 අංක 07 දරන විවාහ පනත ඉදිරිපත් කරමින් මෙරට බලපැවැත්වූ බහු විවාහ තහනම් කරන ලදී. අනතුරුව 1859 අංක 13 දරන විවාහ පනත සම්මත කර ගන්නා ලදී. එමගින් ලංකාවේ පැවතිය හැකි එකම විවාහ ක්‍රමය ඒක විවාහ ක්‍රමය වූ අතර විවාහය ලියාපදිංචි කොට නීත්‍යානුකූල කළ යුතු විය (Rissecuw 1991 : 30-46). මෙසේ වික්ටෝරියානු සමාජ අගයන් මෙරට සමාජය මත ආරෝපණය කරමින්, නීතිගත කරමින් ඇති වූ සංස්කෘතික නිර්මිතයක් වූ විවාහ සංස්ථාවත් එහි ප්‍රතිඵල ලෙස නිර්මිත පවුලත් අභිනව ස්ත්‍රියක් ගොඩනැගීමෙහි සමත් විය. එසේ බිහි වූ ස්ත්‍රිය සාම්ප්‍රදායික ක්‍රියාත්මක වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවී තත්වයත් වික්ටෝරියානු සමාජ අගයත් නියෝජනය කරන බටහිර පුරුෂමූලික සමාජ තත්වයත් ද වශයෙන් දෙආකාරයක බලපෑමට ලක් වූ ආකාරය නිරීක්ෂණය කළ හැකිය. අග පිපි මල් නවකතාවෙහි නිරූපිත අමා මෙරට සමාජ ස්තරණයෙහි ඉහළ තලයක් නියෝජනය කළ ද හුදෙක් ස්ත්‍රියක වීම හේතුවෙන්ම ඇය මුහුණදෙන අර්බුදයේ ස්වභාවය කතුවරිය ඉදිරිපත් කරයි. පුරුෂ කේන්ද්‍රීය සමාජ අවකාශයෙහි ස්ත්‍රිය ද්විතියික ලිංගියෙකුව පරිධිගත වීමෙහි යථාර්ථය එමගින් සමාජගත කෙරෙයි.

නීත්‍යානුකූල විවාහ ක්‍රමයත් සමග අධිආරෝපණය කළ විවාහ සංස්ථාව තුළ වික්ටෝරියානු පරමාදර්ශී බිරිඳ ස්වාමිපුරුෂයාට කීකරු පවුලේ සෙත සලසන, දරුවන් බිහි කිරීම අරමුණු කොට ගත්තෙකි. ස්ත්‍රිය සම්බන්ධ මෙම පුරුෂමූලික ප්‍රවාදය ලාංකේය ධනේශ්වර සමාජ ගොඩනැගීම හා සමපාත වෙමින් යටත්විජිත යුගයෙහි මෙරට බිහි වූ අභිනව සමාජ ක්‍රමයෙහි අවශ්‍යතා පූර්ණය කරන්නක් විය. නව ධනේශ්වර පුරුෂයාට සෑම අතින්ම ගැලපෙන අභිනව ස්ත්‍රියක් ගොඩනැගීමේ ව්‍යාපෘතිය යටත්විජිත යුගය තුළදීම පූර්ණත්වයට පත් විය. ලාංකේය සමාජය විසින් අද දක්වාම පොදු සංස්කෘතික පරමාදර්ශයක් සේ පවත්වාගෙන එනු ලබන්නේ, ආරක්ෂා කරනු ලබන්නේ එකී වික්ටෝරියානු කුල කාන්තාවයි. අමා යනු එකී සවිඥානක පුරුෂමූලික ගොඩනැගීමෙහි එක් දිගුවක්ම පමණක් වන බව අග පිපි මල් නවකතාව ඇසුරෙහි අවධාරණය කළ හැකිය.

යටත්විජිත යුගයෙහි මෙරට ධනවාදී සංවර්ධනයත් එහි ප්‍රතිඵල වශයෙන් ඇති වූ සමාජ සංස්කෘතික විපර්යාසයත් හේතුවෙන් මෙරට ස්ත්‍රිය කෙරෙහි කිසියම් පරිණාමීය බලපෑමක් ඇති විය. ස්ත්‍රී අධ්‍යාපනයේ අභිවර්ධනය, රැකියා අවකාශ විවර වීම, බටහිර පන්නයට හැඩගැසුණු ජීවන ශෛලීන් හා වෙනත් නවීකාරක බලපෑම් හේතු කොට ගෙන ධනපති පන්තික ස්ත්‍රීහු ඇතැම් අවහිරකම්වලින් මිදුණහ. අනෙක් පසින් පීතෘමූලික ව්‍යූහයන් මූලික වශයෙන් ජීවිතයේ සියලු ක්ෂේත්‍රයන්හි නොවෙනස්ව පැවතුණි (ජයවර්ධන 2006 :). මේ අනුව යටත්විජිත යුගයෙහි නූතනත්වයට පත් මෙරට සමාජ සන්දර්භයෙහි ස්ත්‍රීන් සීමිත පිරිසක් භෞතික වරප්‍රසාද ඇසුරෙහි ඉදිරියට පැමිණිය ද එය මෙරට සමස්ත ස්ත්‍රිය පිළිබඳ යථාර්ථයෙහි ප්‍රකාශනයක් ද නොවේ. අග පිපි මල් නවකතාවෙහි අමා නමැති මධ්‍යම පන්තික නීතිඥවරිය නියෝජනය කරන්නේ යටත්විජිත යුගයෙහි මෙසේ යම්

අංශයන්ගෙන් ඉදිරියට පැමිණි එහෙත් පීතෘමූලික ව්‍යූහයෙහි බලපෑමෙන් වියුක්ත නොවූ ලාංකේය ස්ත්‍රියයි. යටත්විජිත යුගයෙහි මෙරට සමාජගතව තිබූ ප්‍රධාන දෘෂ්ටිවාද දෙකකි. එනම් වික්ටෝරියානු ස්ත්‍රිය පිළිබඳ බටහිර දෘෂ්ටිවාදයත් අනගාරික ධර්මපාලගේ දෘෂ්ටිවාදී ප්‍රවේශය වූ ආර්ය සිංහල කුල කත නිර්මාණය කිරීමේ සිංහල බෞද්ධ දෘෂ්ටිවාදයයි. මෙකී දෘෂ්ටිවාද විසින් සමාජගත කරන ලද තත්කාලීන ස්ත්‍රිය විසිඑක්වන සියවසේ අවසන් භාගයේ මෙරට ප්‍රබන්ධගත ස්ත්‍රිය සමග පවත්නා සාම්‍යය අප වටහාගත යුත්තේ කෙසේද? එකී සමානත්වයේ සැබෑ මූලයන් මොනවාද? අග පිපි මල් නවකතාව ඔස්සේ විමසා බැලිය යුතු යථාර්ථය එයයි. අමා නමැති මධ්‍යම පන්තික නීතිඥ ස්ත්‍රිය ප්‍රතිනිර්මාණය කරන ලේඛිකාව නියෝජනය කරන තත්කාලීන සමාජ විඥානය මෙරට ස්ත්‍රිය කෙරෙහි බලපවත්වන ආකාරය මේ මගින් ප්‍රකාශයට පත් වේ. ස්ත්‍රිය සම්බන්ධ දෘෂ්ටිවාද ගොඩනගන පුරුෂමූලික සමාජ සංස්කෘතික බලාධිකාරයෙහි පවත්නා අනම්‍ය සුලු බව මේ මගින් අවධාරණය කෙරේ. ඒ අනුව යටත්විජිත ලාංකේය ස්ත්‍රිය මෙන්ම විසිඑක්වන සියවස අග භාගයෙහි නිර්මාණය කෙරෙන ස්ත්‍රිය ද සමාන වීම තුළ අපට ප්‍රත්‍යක්ෂ වනුයේ ස්ත්‍රිය පිළිබඳ මෙරට අඛණ්ඩව බලාත්මක වන පුරුෂ මූලික සමාජ දෘෂ්ටියෙහි පවත්නා නොවෙනස් වන සුළු බවයි. එනම් දීර්ඝ කාල පරාසයක ලාංකේය පුරුෂයා මෙරට ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංජානනය කිරීමේ ක්‍රියාවලිය තුළ ස්ත්‍රිය සහ පුරුෂයා පුනර්නිෂ්පාදනයට ලක් කිරීමේදී  ස්ත්‍රිය තව දුරටත් පුරුෂමූලික අධිකාරයේ සීමා අතික්‍රමණයෙහි අසමත් දෙවන පුරවැසියකු බවට ඌනනය කෙරී ඇති බවයි. මක් නිසාද යටත්විජිත යුගයෙහි ක්‍රියාත්මක වූ ස්ත්‍රී අධ්‍යාපනය, ශ්‍රමය ආදිය පිළිබඳව වූ කතිකාව පුරුෂාධිපත්‍ය සාධක මගින් ගොඩනැගුනක් වන බැවිනි ((De Mel 2002, Wickramasinghe 2016). ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි ප්‍රභවය එය ක්‍රියාත්මක වන සමාජ සංස්කෘතික පරිස්ථිතියම වන බැවින් ඊට සාපේක්ෂ වශයෙන් පරිණාමයට ලක්වේ. සමාජයක් මෙහෙයවන බලාධිකාරයෙහි දෘෂ්ටිමය ආස්ථානයෙහි ස්වභාවය සාපේක්ෂව ඕනෑම සංස්කෘතියක් කාලය හා අවකාශයට අනුව පරිණාමයට ලක්වේ. ලාංකේය සමාජය නූතනත්වයට ප්‍රවිශ්ට වූ යටත්විජිත අවධියෙහි පුනර් නිෂ්පාදිත ස්ත්‍රීත්වය මෙරට විසිඑක්වන සියවස අග භාගයේ ස්ත්‍රී නිර්මිතයෙන් අතික්‍රමණය වී තිබීම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංකල්පයෙහි ගතිකත්වය සනාථ කරයි. යටත්විජිත සමාජයේ පුරුෂයාට පමණක් විවෘත වූත් නම්බුකාර වූත් නීතිඥ, වෛද්‍ය වැනි වෘත්තීන් වෙත දහනවවන සියවස අග භාගය පමණ වන විට මෙරට ධනපති පන්තික ස්ත්‍රීන්ට ද පිවිසීමේ අවකාශ විවර විය (Jayaweera 1979 : 266).  මෙරට ස්ත්‍රිය විෂයෙහි අධ්‍යාපනය හා වෘත්තීය ක්ෂේත්‍රයෙහි කිසියම් ප්‍රසාරණයක් ඇති කෙරෙමින් සිදු වූ මෙම සමාජ පරිණාමය විසිඑක්වන සියවස අග භාගය පමණ වන විට නිදහස් අධ්‍යාපනයෙහි බලපෑමෙන් පොදු ස්ත්‍රිය වෙත විවෘත විය. අමා යනු එසේ ප්‍රතිනිෂ්පාදිත නූතන මධ්‍යම පන්තික ස්ත්‍රියගේ සාහිත්‍යික ප්‍රකාශනයයි. එනම් මධ්‍යම පන්තික ලාංකේය ස්ත්‍රිය සම්බන්ධව නූතන පුරුෂමූලික චින්තනය තුළ නිර්මිත පරිකල්පනීය යථාර්ථයෙහි ස්වභාවයයි. පූර්ව යටත්විජිත යුගයෙහි ස්ත්‍රිය සම්බන්ධයෙන් වූ පොදු පුරුෂ කතිකාව මූලික වශයෙන් ස්ත්‍රී සෞන්දර්ය කේන්ද්‍ර කොට ගත්තක් වූ අතර යටත්විජිත යුගයෙහි නූතනත්වයට පිවිසි මෙරට සමාජ සන්දර්භයෙහි එකී කතිකාව

ස්ත්‍රියගේ උපයෝගීතාව කේන්ද්‍ර කොට ගත්තක් විය. අග පිපි මල්හි අමාගේ චරිතය මගින් සුමිත්‍රා ප්‍රතිනිර්මාණය කරන්නේ ධනේශ්වර සමාජයේ හුදෙක් ගනුදෙනු තත්වයට ඌනනය වූ මානව සබඳතාවන්හි එකී යථාවයි. එයින්ම අග පිපි මල් නවකතාව, එය ප්‍රකාශිත යුගයෙහි පිළිබිඹුවක් වන්නා සේම එහි අන්තර්ගයට අදාළ සමාජ සංස්කෘතික කතිකාවෙහි ප්‍රකාශනයක් ද වෙයි.

නීතිඥ වෘත්තිය මගින් අමා නම් ස්ත්‍රිය ආර්ථික වශයෙන් ශක්තිමත් තලයකට ඔසවා තබන කතුවරිය නිවසක වාහනයක හිමිකාරියක ලෙසත් දරුවන්ගේ නඩත්තුව වෙනුවෙන් පුරුෂයා ලබා දෙන නඩත්තු මුදල ද ප්‍රතික්ෂේප කිරීම දක්වා ඇය අදීන චරිතයක් ලෙස නිරූපණය කරයි. එහෙත් දෘශ්‍යමානය තුළ නීතිඥ වෘත්තියට පිවිසීමේ සමාන අවස්ථා ස්ත්‍රිය වෙත විවෘත කොට තිබුණ ද එයට පිවිසි ස්ත්‍රියකගේ කාරකත්වය අවතක්සේරු කිරීමටත් ආර්ථික උත්පාදන ක්‍රියාවලිය අඩපණ කිරීමටත්, සමාජ අවමානයට පාත්‍ර කිරීමටත් එම පුරුෂමූලික බලාධිකාරයම ක්‍රියාත්මක වන ආකාරය කතුවරිය නිරූපණය කරයි. සුදුසුකම් සමාන වුවද එම අවස්ථා තුළ ස්ත්‍රියගේ වෘත්තීය සාර්ථකත්වය අභියෝගයට ලක් කිරීමට පුරුෂමූලික සමාජ කතිකාව උත්සුක වන ආකාරය මින් ප්‍රකට වේ.

> ''කොච්චර ඇයො රස්තියාදු වෙනවද කළුකෝට් දාගෙන ගස් යට? අමා ඉගෙනගත්තට අත්දැකීම් මදි. අනික ලේඩි ලෝයර්ස්ලාට නඩු එනව අඩුයි'' (රාහුබද්ධ 1998 : 63).

> ''ගෑනුන්ට හොඳ කන්තෝරුවක කරන රස්සාවක් මිසක් ගිනි කන රස්සාවල් නෙවි'' (රාහුබද්ධ 1998 : 72).

සුමිත්‍රා ගොඩනගන ස්ත්‍රිය මේ පුරුෂමූලික ආකල්පවලට අභියෝග කරන අතරම ස්ත්‍රිය සතු අදීනත්වය සහ මානසික ශක්තිය උත්කර්ෂයට නංවයි.

''අලුතින්!
ඔව් අලුතින්!
දෙවන වරටත්!
ප්‍රථමයෙන් හැඩ ගැසිය යුතුය.
ශක්තිමත් විය යුතුය.
යෝධ බල යෝධ ශක්තිය
පිරිමින්ගේ රාජධානියක
කිරුළ පළඳින්නට''

(රාහුබද්ධ 1998 : 30).

පුරුෂමූලික සමාජයෙහි ආන්තීකරණය කළ ස්ත්‍රිය ආර්ථික, වෘත්තීය හා සමාජ අභියෝග ජයගැනීමෙහිලා අවශ්‍ය කාරක ශක්තියෙන් යුතු වන බව නිරූපණය කරන කතුවරිය ඒ ඔස්සේ බැලූ බැල්මට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අභියෝග කිරීමෙහි සමත් ස්ත්‍රියක් පාඨකයා වෙත ඉදිරිපත් කරයි.

> ''කවුරුත් කිව්වට නෙවෙයි මං තීරණයක් ගත්තෙ මටම හිතිච්ච් හින්දා. නොන්ජල් ගෑනියෙක් වෙලා එක එක්කෙනාගෙ අනුකම්පාවට ලක් වෙනවට වැඩිය මං ලෑස්තියි දරදඬු ගෑනියෙක් වෙන්න'' (රාහුබද්ධ 1998 : 66).

පුරුෂමූලික ලෝක දෘෂ්ටිය තහවුරු කරමින් විය හැකි පරිදිම සමාජ සංස්කෘතික වශයෙන් ඇය වෙත එල්ල වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පීඩනය අතික්‍රමණයෙහි ඇය අසමත් වීමේ යථාර්ථය මෙහිදී ප්‍රකට කෙරේ. ලූනචරස්කිට අනුව ලේඛකයාගේ දැනුම ඇතිව හෝ නැතිව හැම සාහිත්‍ය කෘතියකින්ම ඔහු නියෝජනය කරන පංතියේ චින්තන මාර්ගය ධ්වනිත කෙරේ (Lunacharsky : 1965, උපුටා ගැනීම සුරවීර 1982 : 26). සුමිත්‍රා ගොඩනගන ස්ත්‍රිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අභියෝග කිරීමෙහි සමත් මධ්‍යම පන්තිය නියෝජනය කරන්නියක් ලෙස නවකතාවෙහි මුල් අර්ධයෙහි ක්‍රියාත්මක වෙයි. එහෙත් කතුවරියගේ සවිඥානක අභිලාෂයට, උත්සාහයට අභියෝග කරමින් ඇයතින් ගිලිහී යන චරිතය ඇයගේ උප විඥානයෙහි තැන්පත්ව ඇති ඇය ද නියෝජනය කරන මධ්‍යම පන්තියෙහි පුරුෂ මූලික සාමූහික විඥානයෙහි පිළිබිඹුවක් බවට පත් වේ. එනම් ස්ත්‍රියක වශයෙන් බිහිවීමෙන් උපතින්ම පුරුෂයාට සාපේක්ෂව පහත් සමාජ තත්වයක් ඇය රැගෙන එන බැවින් ඇය කටයුතු කළ යුත්තේ පුරුෂ මූලික සීමාවන්ට යටත්ව වන බව පැහැදිලි කරයි. අනියම් සම්බන්ධතාව හේතුවෙන් විවාහයෙන් ඉවත් කොට දමන අසිත මෙන්ම චන්දන, එඩ්මන් වීරපාන, ජයදේව, නලින්, විජිතසේන සහ චන්ද්‍ර ගුප්ත ආදී වූ සියලු පුරුෂ චරිත සමාජ සංස්කෘතික වශයෙන් මෙරට ස්ත්‍රිය රැඳවූ සීමා අතික්‍රමණය කිරීමට අමා ගත් උත්සාහය ව්‍යර්ථ කිරීමේ අරමුණින් ඇයට තර්ජනය කළහ. 'දික්කසාදය' යන එකම නීතිමය තත්වය මෙරට ස්ත්‍රියට හා පුරුෂයාට ලබා දෙන්නේ දෙවැදෑරුම් වූ සමාජ සංස්කෘතික තත්වයකි. එනම් එය පුරුෂයා විෂයෙහි ධනාත්මක ලෙස බලපාන අතර ස්ත්‍රිය විෂයෙහි සෘණාත්මක තත්ව නිර්මාණය කරයි. දික්කසාදය අසිතට නව ජීවිතයකට සුබදායී ආරම්භයක් ලබා දෙන අතරම අමාට ආර්ථික අභියෝග, දරුවන්ගේ වගකීම්, සමාජ පිටුදැකීම්වලට මගපාදයි. ස්ත්‍රියකට පුරුෂයකුගේ ආරක්ෂාවෙන් පරිබාහිර වූ ස්වාධීන පැවැත්මක් නොවන බවට වන පුරුෂ මූලික ආකල්පය කතුවරිය විසින් සනාථ කරනු ලබයි.

> ''......ඔව් මම එහෙම කළා. එහෙම කළේ ගෑනියෙකුට නම්බුවක් කියල දෙයක් ඕන නිසා. ගෑනියෙක් උනාම සල්ලි පස්සෙයි ප්‍රසිද්ධිය පස්සෙයි ඉවක් බවක් නැතුව දුවන්න නරකයි'' (රාහුබද්ධ 1988 : 68).

මුදල් හා ප්‍රසිද්ධිය අත්පත් කර ගැනීමේ ව්‍යාපෘති හුදෙක් පුරුෂයාට පමණක් අයත් කටයුත්තක් වන බවත් එකී වපසරිය ආක්‍රමණය කිරීම ස්ත්‍රියට තහනම් වූත් අකැප වූත්

දෙයක් බවට වූ පුරුෂමූලික අර්ථකථනය කතුවරිය උක්ත ප්‍රකාශය මගින් තහවුරු කරයි. ස්ත්‍රියගේ සචලතාව සහ නිදහස මෙසේ පුරුෂ පාලනයට නතු කිරීම ස්ත්‍රී පුරුෂ විභේදනයෙහි අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස අවධාරණය කෙරේ (භාසින් 2000 ː 10-11).

එමෙන්ම ස්ත්‍රියගේ හා පුරුෂයාගේ එකම හැසිරීම් විලාසයට සමාජ අර්ථ නිර්මාණය වන්නේ එකම ලෙසින් නොවේ. පුරුෂයා කුටුම්බයෙහි හෝ සමාජයෙහි අසංවර වුවද, කෝපකාරී වුවද කලහකාරී වුවද එය පිරිමි ගතියයි. එහෙත් ඊට සාපේක්ෂව ස්ත්‍රිය සංවර විය යුතුය. අහිංසක විය යුතුය.

> ''මේ නඩු හබ ඉවර උනාට පස්සෙ මම හිතාගෙන ඉන්නවා හොඳ ගුණ යහපත් කෙනෙක්ව කසාද බඳින්න'' (රාහුබද්ධ 1988 ː 68).

වික්ටෝරියානු පරමාදර්ශී ස්ත්‍රිය ස්වාමියාට කීකරු, පවුලේ යහපත සලසන, දරුවන් බිහි කිරීම අරමුණු කොට ගත් අයෙකි (Rozak & Rozak (eds.) 1969 : 72) යන පුරුෂමූලික ප්‍රවාදය මේ මගින් තහවුරු කෙරේ. එමෙන්ම පුරුෂ ගතිගුණ ලෙස තාර්කිකත්වය, ශක්තිමත් බව, කඩවසම් බව, ආක්‍රමණශීලී බව හා තරඟකාරීත්වය සමාජය පිළිගන්නා අතර ස්ත්‍රිය හැඟීම්බර, දුර්වල, රූමත්, කැප කරන සුළු, අවනත, සංවරශීලී බවින් පිරිපුන් වූවෙකු විය යුතුය (Renzetti and Curran 1992 : ….; භාසින් 2005 ː 27) සහ පුරුෂමූලික අර්ථකථනයන්ට අනුව 'ගුණ යහපත්' යන්න අර්ථගන්වා ගැනීමේ දී වික්ටෝරියානු සමාජ අගයන් මත පදනම් වූ යුරෝ කේන්ද්‍රීය බලපෑම් මත ගොඩනැගුණු සදාචාර සංකල්ප තහවුරු කොටගත් ව්‍යාපෘතිය තීරණාත්මක වේ. මන්ද කිසියම් සමාජයක නිශ්චිත කාල අවකාශයක එම සමාජයේ සංස්කෘතික ක්‍රියාවලිය විසින් ගොඩනගනු ලබන සදාචාර කතිකාවේ ප්‍රතිඵලය මත මෙම අර්ථ දැක්වීම් පදනම් වන බැවිනි. ඒ අනුව ස්ත්‍රිය හා සම්බන්ධ 'යහපත්' යන්න අර්ථ ගැන්වීමේ දී අනිවර්යයෙන්ම පුරුෂමූලික පැවැත්ම තහවුරු කොට පවත්වාගෙන යාමේ, ඊට අභියෝගයක් නොවීමේ අවශ්‍යතාව පූරණය අනිවාර්ය වූවකි. අමාගේ චරිතය හරහා ලාංකේය සමාජය හා සම්බන්ධ මේ පුරුෂමූලික යථාර්ථය සුමිත්‍රා ප්‍රතිනිර්මාණය කළ ද ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පීඩනයට එරෙහිව නැගෙන බලමුළු ගැන්වීමේ, ඥානනය කිරීමේ අවකාශ අහිමි කර ගනී. එනම් ස්ත්‍රිය සම්බන්ධයෙන් වන තත්කාලීන පුරුෂමූලික දෘෂ්ටිවාද නිරූපණය ඉක්මවූ තලයක ඒවා පුපුරා හැරීමෙහිලා අවශ්‍ය ඥානමය සම්ප්‍රදානය ලබා දීමෙහිලා ඇය අපොහොසත් වේ. දික්කසාද වූ දරු දෙදෙනෙකුගේ මවක් වූ අමා යනු වෘත්තිය හා ආර්ථික ශක්තිය විසින් ශක්තිමත් කරන ලද ලාංකේය ස්ත්‍රියයි. මධ්‍යම පන්තික සමාජ ස්තරය නියෝජනය කිරීම හේතුවෙන්ම ඇයට ජීවන අභියෝග උසුලා දරා සිටීමේ සාපේක්ෂ හැකියාවක් පවතී. එහෙත් කතුවරිය එසේ ශක්තිමත් කළ ස්ත්‍රිය ස්ත්‍රීත්වයට අභියෝග කිරීමට භාවිත කරන අතිශය සුලබ පුරුෂමූලික උපක්‍රමය භාවිත කිරීමෙන් පරාජය කොට දැමීමට ඉඩහරියි. කතුවරිය නියෝජනය කරන පන්තිමය ආස්ථානය හා සම්බන්ධ අධිපතිවාදී ලෝක දෘෂ්ටිය තුළ ඇය ද අවිඥානකව හෝ සවිඥානකව දෘෂ්ටිගතවීම ඊට හේතුවයි. ස්ත්‍රීත්වයේ 'මුද්‍රාව' ලෙස සමාජය ආරෝපණය කරන ලද පතිවත හා ලිංගිකත්වය

පුරුෂ සමාජය ලවා අමා වෙත ඉදිරිපත් කරවයි. පුරුෂයකුගේ හවිහරණක් නොමැතිව ජීවත්විය නොහැකිය, තනිව දරු දෙදෙනෙකුගේ බර දරමින් ආර්ථික වශයෙන් ගමනක් යා නොහැකිය, පුරුෂයින්ට වෙන් වූ නීති වෘත්තිය වැනි වෘත්තීන්හි ස්ත්‍රියට පැවැත්මක් හෝ ඉදිරියක් නොමැත යන ස්ත්‍රීන්ට එරෙහි පොදු සමාජ කතිකා සියල්ලට අභියෝග කළ අමා, පුරුෂමූලික සදාචාර උගුලෙහි හිර කරයි. ආර්ථික වශයෙන් පුරුෂමූලික දෘෂ්ටිවාද අතික්‍රමණය කළ ලේඛිකාව ශුද්ධ පුරුෂමූලික ගොඩනැගීම් අභියස පරාජය වෙයි. එනම් පුරුෂමූල අධිපති කතිකාව විසින් තහවුරු කිරීමට උත්සුක වන විවාහයෙන් පරිබාහිර ලිංගික සබඳතා පැවැත්වීම ස්ත්‍රියට තහනම් බව හා නීත්‍යානුකූලව ස්වාමියාගෙන් වෙන් වී සිටිය ද වෙනත් පුරුෂයින් සමග ලිංගික සබඳතා පැවැත්වීම ස්ත්‍රියට නුසුදුසුය යන්නට කතුවරියගේ අනුමැති ලැබේ. අමා එකී මතවාදයට අනුගත වන්නේත් අහේතුක සමාජ විවේචන, ගැරහීම් හමුවේ ඇය පසුබසින්නේත් කතුවරියගේ අභිමතයෙනි. එමගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනයේ පීඩක ආයුධයක් පුරුෂ සමාජය අතට පත් කරයි. ඉන් නොනවතින කතුවරිය විසින් තමා හා දරුවන් අතැර වෙනත් විවාහයක බැඳෙන පුරුෂයකු වෙනුවෙන් 'පතිවත' රකින ස්ත්‍රියක ද නිර්මාණය කරනු ලබයි.

අහේතුකව තමා හැර යන අසිත ඉදිරියේ ඇය හැසිරෙන්නේ ද දුර්වල පෞරුෂයකිනි. ලේඛිකාව එය අර්ථ දක්වන්නට උත්සාහ දරන්නේ 'ස්ත්‍රීත්වය' ලෙසිනි. 'ගැහැනු ගතිය' ලෙසිනි. එහෙත් මෘදු බව, ළතැවිල්ල, කම්පා වීම, පරිත්‍යාගශීලීත්වය ආදිය ස්ත්‍රීත්වය මත පුරුෂමූලික සමාජය විසින් ආරෝපණය කරන ලද ගුණාංග වන බව කතුවරිය නිරාවරණය (අවධාරණය) නොකරයි. එහෙයින්ම ස්ත්‍රියක ලෙස අමා මුහුණදුන් සමස්ත ව්‍යවසනයන්හිම මූලය වූ දික්කසාද වූ තම පුරුෂයාගේ ළපැත්තේ හිස හොවා වැළපෙන ස්ත්‍රියක අග පිපි මල් නවකතාව අවසානයේ නිර්මාණය වී ඇත්තේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ලාංකේය සමාජයේ බලපවත්වන අධිපති සමාජ පංතිය නියෝජනය කරන දෘෂ්ටිවාදය සමග ලේඛිකාවගේ අනුගත වීමක් ලෙස මේ අනුව අර්ථකථනය කෙරේ. එනම් ආරම්භයේ සිට පුරුෂමූලික සමාජය විසින් ගොඩනගන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කතිකාව හා සම්බන්ධ දෘෂ්ටිවාදයෙහි පැවැත්ම තහවුරු කිරීමෙහි සමත් චරිත නිරූපණයක් ලෙස හඳුනාගැනේ.

ස්ත්‍රියක් තුළ පුරුෂයකු කෙරෙහි පවත්නා 'නොකැලැල් ප්‍රේමය' හුදෙක් ප්‍රේමයේ ස්වභාවය ලෙස නිර්මාණය කරනවා ද? ස්ත්‍රීත්වයේ ස්වභාවය ලෙස නිර්මාණය කරනවා ද? කතුවරිය අබියස වන අභියෝගය එයයි. පුරුෂමූල භෞතික අභියෝග හමුවේ ජයග්‍රාහිකාවක් ලෙස නිරූපිත ස්ත්‍රිය ආධ්‍යාත්මික වශයෙන් පරාජිත වන්නේ ස්ත්‍රියට ආරෝපිත සදාචාරාත්මක වටිනාකම අත්‍යවශ්‍ය සමාජ අංගයක් ලෙස ලාංකේය සමාජය පරිකල්පනය කිරීමේ යථාර්ථය හේතුවෙන් ද? ඉවසීම, යටහත්පහත් බව, කරුණු දැන නොදැන සේ සිටීම, හික්මීම ආදියෙන් නිර්මිත 'වික්ටෝරියානු' ස්ත්‍රී සංකල්පයත් ජාතිකත්ව ව්‍යාපෘතියෙහි නිර්මිතයක් වූ 'ආරිය සිංහල කුල කත' සම්බන්ධ සමාජ කතිකාවත් ඇසුරෙහි ගොඩනැගුණු මෙරට සමකාලීන ස්ත්‍රීත්වය තවදුරටත් තහවුරු වීමේ යථාර්ථයෙන් පාඨකයා ඥානනය කිරීම කෘතියේ පරමාර්ථය ද?

අමා මෙන්ම මෙහි නිරූපිත කුසුමාවතී හා අයෝමි වැනි ස්ත්‍රීන් ද ස්වකීය ස්වාමියාට දිකකසාදය ලබා දෙන්නේ නිදහසේ ඔවුන්ට රිසි සේ ජීවිතය ගොඩනගා ගැනීමටයි. මෙකී චරිත නිරූපණය සමාජ නිර්මිතයක් වූ ස්ත්‍රීත්වය තවදුරටත් දරා ගැනීමේ සංකේත ලෙස ඉදිරිපත් වේ. ආරම්භක වශයෙන් කිසියම් ජයග්‍රාහී ස්ත්‍රියක් නිරූපණය කරන කතුවරිය අවසන අභියෝග ඉදිරියේ ශක්තිමත් ස්ත්‍රියකට වුවද සම්මත සමාජ ගොඩනැගීම් අභියෝග යට ලක් කළ නොහැකි බවට වන ප්‍රතිගාමී දෘෂ්ටිය විශද කරයි.

## නිගමනය

සමස්තයක් ලෙස ගත් කල අග පිපි මල් හි නිරූපණය වන්නේ දිවි හිමියෙන් විවාහක පුරුෂයා පමණක්ම පතන, තමා හැර ගියද ඔහු වෙනුවෙන් දිවි කැප කරන සදාචාරයේ ස්ත්‍රියයි. පුරුෂත්වයට අභියෝගයක් වූ හැම විටම ඇයට අත් වූ පරාජයෙන් ඒ බව අවධාරණය කෙරේ. ඒ අනුව ලාංකේය සමාජ සන්දර්භයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය යළි යළිත් තහවුරු කරමින් ස්ත්‍රිය ද්විතියික ගනයේ පුරවැසියෙකු ලෙස ඌනනය කෙරෙන ආකාරය මෙම නවකතාවෙහි ප්‍රකට වේ. එනම් සංස්කෘතික වශයෙන් ලාංකේය ස්ත්‍රියගේ පීඩිත ජීවිතය සියුම් ලෙසත් කිසියම් සූක්ෂ්ම ආකාරයෙනුත් මතු කරමින් මෙරට සමාජ පරිස්ථිතියෙහිලා ඇයගේ ශෝකාන්තය පිටපත් කරනු විනා කතුවරිය එය අතික්‍රමණයට ඇවැසි ශක්තිය සැපයීමෙහි අපොහොසත් වෙයි. පරිධිගත වූ බල කේන්ද්‍රයේ සකලවිධ පීඩනයෙන් මඩිනු ලබන ස්ත්‍රී පාර්ශ්වයෙහිම නියෝජනයක් වූ සුමිත්‍රාගේ හඬ, ඇය ද අයත් වන මධ්‍යම පන්තික සමාජ සංස්කෘතික කතිකාව හමුවේ බලරහිත වූ ආකාරය මෙයින් විශද වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ පුරුෂමූලික දෘෂ්ටියෙහි දීර්ඝකාලීන බලපෑමට ලක් වූ ද ලාංකේය සමාජ පැවැත්ම තුළින්ම පුරුෂමූලික බලපෑමෙහි පීඩනය දරා සිටියා වූ ද ස්ත්‍රියක ලෙස කතුවරියට මෙකී දෘෂ්ටිමය සීමා අතික්‍රමණය අභියෝගයක් වූ බව පෙනේ.

ස්ත්‍රී කර්තෘක ස්ත්‍රී කේන්ද්‍රීය නවකතාවක් වූ අග පිපි මල් නවකතාවෙහි ප්‍රකට වන්නේ කාලමය වශයෙන් මෙන්ම දෘෂ්ටිමය වශයෙන් ද මෙම සමාජ දේහය මත ආරෝපිත පුරුෂමූලික දෘෂ්ටිවාදය කෙතරම් ප්‍රබල ලෙසත් තීරණාත්මක ලෙසත් තහවුරු වී පවතීද යන්නයි. සමාජ ප්‍රවාහය හා සම්බන්ධ මෙන්ම ඒ පිළිබඳ අවධානාත්මක සංවේදී ක්‍රියාකාරී ලේඛකයකුගේ නිර්මාණයකින් ප්‍රකාශ වන්නා දේ අතිශයින් වැදගත් වේ. ලේඛකයා ප්‍රකාශ කිරීමට බලාපොරොත්තු වූ දෙය සැබෑ වශයෙන් කෘතියෙන් ප්‍රකාශ වූ දේ තරම් වැදගත් නොවන බවටත් දෘශ්‍යමාන තුළ සත්‍ය මතු කිරීමට ගත් උත්සාහයේ ඵලයක් ලෙස ඇතැම් විට කතුවරයාගේ අනුදැනුමෙන් තොරවම කෘතියෙන් ප්‍රකාශ වන්නා වූ දෙය අතිශය වැදගත් විය හැකි බවටත් සාහිත්‍ය විචාරකයකු වූ ලූකාස් ගොඩනගන තර්කය මෙහිදී වැදගත් වේ (Lukacs 1972 : 113). පූර්වයෙන් තර්ක කරනු ලැබූ ලුනවරස්කිගේ සාහිත්යික ප්‍රකාශනයත් ලූකස්ගේ මෙකී තර්කයත් අපට සහේතුක නිගමනයකට එළැඹීමේ පදනම සපයයි. එනම් අග පිපි මල් නවකතාව මගින් ප්‍රතිනිර්මාණය කිරීමට ලේඛිකාව උත්සුක වූ ලාංකේය මධ්‍යම පන්තික ස්ත්‍රිය සම්බන්ධ තත්වය ඉක්මවූ තලයක මෙරට ස්ත්‍රියගේ යථාර්ථය කෘතිය

තුළින් ප්‍රකට කෙරී ඇති බවයි. බැලූ බැල්මට භෞතික වශයෙන් එනම් මූලිකව ආර්ථික හා වෘත්තීය තත්වයෙන් ජයග්‍රාහී ස්ත්‍රියක් ගොඩනැගීමෙන් මෙරට ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනයට අභියෝග කිරීමට සමත් වුවද, සමාජ සංස්කෘතික වශයෙන් ජයග්‍රාහී ස්ත්‍රියක් නිර්මාණය නොවීමේ සත්‍යයයි. එහෙයින්ම ස්ත්‍රී කර්තෘක ස්ත්‍රී කේන්ද්‍රීය සාහිත්‍යයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවී විභේදනය ස්ත්‍රීවාදී දෘෂ්ටියකින් ගොඩනොනැගීමේ නැතහොත් පුරුෂ මූලික දෘෂ්ටිවාදයටම ඌනනය වීමේ අර්බුදය සහ එහි පසුබිම සිංහල ප්‍රබන්ධ සාහිත්‍යය ඇසුරෙහි ගැඹුරින් සාකච්ඡා කළ යුතුව පවතී.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ආරියපාල, ඇම්. බී. 1962. **මධ්‍යකාලීන ලංකා සමාජය**, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එල්ලාවල, හේම 1964. **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය**, කොළඹ : ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

ජයවර්ධන, ජානකී (සංස්.) විජේතුංග, ඩබ්.එම්.කේ. 2012. **ශ්‍රී ලාංකේය ඉතිහාසය**, වෙළුම

IV, කොළඹ : ගුණසේන සහ සමාගම.

දෝෂි, එල්.එස්. 2016. **නූතනත්වය, පශ්චාත් නූතනත්වය සහ නව සමාජ න්‍යාය** (පරි.) ප්‍රේමකුමාර ද සිල්වා, අබේරත්න අත්තනායක), කොළඹ : ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවෙට් ලිමිටඩ්).

2007. **නූතනත්වය යනු කුමක්ද?** සංවාද, 27 කලාපය, කොළඹ : සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

පල්ලියගුරු, චන්ද්‍රසිරි (1992). 2002. **සාහිත්‍යය සමාජ විද්‍යාව පිළිබඳ හැඳින්වීමක්**, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

භාසින්, කමලා2000. **ගැහැනු ළමයා යනු කවරෙක්ද?** කොළඹ : සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

2000. **පීතෘ මූලිකත්වය යනු කුමක්ද?** කොළඹ : සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

මුණසිංහ, ඉන්ද්‍රානි 1998. **පැරණි ලක්දිව කාන්තාව**, කර්තෘ ප්‍රකාශනයකි.

රාහුබද්ධ, සුමිත්‍රා 1998. **අග පිපි මල්**, මහරගම : තරංජී ප්‍රින්ටර්ස්.

**ලංකාවේ අධ්‍යාපන සියවස ප්‍රකාශනය** (1969). 1995. සංස්කෘතික යූ.ඩී.අයි. සිරිසේන, කොළඹ

: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ, නීරා 2012. සංස්.) විජේතුංග, ඩබ්.එම්.කේ. 2012. **ශ්‍රී ලාංකේය ඉතිහාසය**, වෙළුම

IV, කොළඹ : ගුණසේන සහ සමාගම.

විජයතුංග, හරිශ්චන්ද්‍ර (සංස්) 1998. **නීති නිඝණ්ඩුව**, කොළඹ :.....

විජේගුනසිංහ, පියසීලි 1995. **මාක්ස්වාදී කලා විචාරයේ මූලධර්ම**, සාරා ප්‍රකාශන.

1989. 2005. **නූතන සිංහල සාහිත්‍ය විචාරය : මාක්ස්වාදී අධ්‍යයනයක්**, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර, ඒ.වී. 1982. **සමාජීය සාහිත්‍ය අධ්‍යයනය**, කොළඹ : සී/ස. ලේක්හවුස් ප්‍රින්ටර්ස් සහ පබ්ලිෂර්ස් සමාගම.

De Silva 1981. **A History of Sri Lanka**, London University of California Press.

De, Mel Neloufer 2002. **Woman and the Nations Narrative Gender and Nationalism in Twentieth Century Sri Lanka**, Colombo.

Hayley, F.A. 1923. **A Treatise on the Laws and Customs of the Sinhalese**, Colombo.

Hennietta, L. 1984. **Divided We Stand: Sex: Gender and Sexual Difference**, Cambridge Polity Press.

Jayaweera, Swarna 1979. Womin in Sri Lanka, Asian Development Bank.

Lukas, Gyorgy 1972. **The Meaning of Contemporary Realism London** : Bertrams Print.

Lunacharasky, A. 1965. **On Literature and Art**, Moscow Progress Publishers.

Mend Margaret 1964. **Anthropology**, New York.

Mill, Stuart John 1859. **On liberty**, John W. Peran & Sons, West Strand, UK.

Murdock, G.P. 1949. **Social Structure**, Macmillan Company.

Orkley, A. 1974. **The Sociology of House Work**, London : Martin Robertson.

Parsons, Talcott 1955. **Family, Sociolization and Interaction Process**, New York: Free Press.

Ray Bharati 1995. **From the Seames of History : Essays on Indian Woman**, Oxford University Press, New Delhi.

Renzetti, M.C. and Curran, J.D. 1992) **Woman and Society**, U.S.A., Allyaamd Bacon.

Risseeuw 1991. **Gender Transformation : Power and Resistance Among Women in Sri Lanka**, Delhi.

Robert, Stoller 1968. **Sex and Gender**, Science House, New York.

Roberts Michael (ed.) 1997. **Sri Lanka Collection Indentities**, Marga Institute.

Rozak & Rozak (eds) 1969. **Masculine**, Vijitha Yapa, Feminine Harper and Row, New York.

Wickramasinghe, Nira 2006. **Sri Lanka in the Modern Age : A His of Contested Identities,** Colombo.